**ශීර්ෂය -205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝබර් 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා අවශ්‍ය රු.371,000ක් වූ මුළු ප්‍රතිපාදනයම සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.188,253 ක් හෙවත් සියයට 33 සිට සියයට 55 ක් දක්වා ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බැවින් ගොඩනැගිල්ලෙහි සුලු අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සීමා කිරීම නිසා 2001 වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම සිදු විය.<br><br>2020 වර්ෂයේ රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පුහුණු වැඩසටහන් අදාල පුහුණු ආයතන මඟින් නොපැවැත්වීම මෙන්ම ඒවා සඳහා නිළධාරීන් යොමු කිරීමට නොහැකි අවධානම් තත්ත්වයක් පැවතීම මත 2401 වැය විෂය යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම සිදු විය. | වෙන්කරවා ගත් ප්‍රතිපාදන භාවිතයට ගත යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හා සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | -------------------------------------------- | ----------- |
| (අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයේ කාර්යසාධන දර්ශක 07 ක් හඳුනාගෙන තිබුණද කාර්යසාධන වාර්තාව අනුව අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම දක්වා ඇත්තේ කාර්යසාධන දර්ශක 05 ක් සඳහා පමණි. ඉන් කාර්යසාධන දර්ශක 03 ක අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබෙන පොලී ප්‍රතිශතය අඩු වීම මත භාර වල ආදායම් තත්ත්වය අඩු වීම නිසා භාර අරමුණු අපේක්ෂිත මට්ටමින් ඉටුකිරීමට අපහසු වීම හා 2020 වර්ෂය පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කාර්යාල කටයුතු සාමාන්‍ය පදි පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් මතුවීම මෙම කාර්යසාධන දර්ශකයන්හි තත්‍ය නිමවුම අඩුවීමට හේතු විය. | හඳුනාගත් කාර්යසාධන දර්ශකවල අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම් දැක්විය යුතු වීම. |
| (ආ) මහා භාරකාරතැනගේ බලතල සහ කාර්යභාරයට අමතරව වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැනගේ මැදිහත් වීම පහත සඳහන් පරිදි විය යුතු විය.<br><br>• 1988 අංක 61 දරන පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගිය හොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම සහ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන ශ්‍රී ලාංකික පුරවැසියන් සේවා නියුක්තියෙහි යෙදී සිටියදී මරණයට පත් වූ අවස්ථාවක යම් වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාරවරයා | අදාල කාර්යයන් හඳුනාගෙන ඉදිරියේදී කාර්ය සාධන දර්ශනයන්ට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයයන් කාර්යසාධක දර්ශක ලෙස හඳුනාගත යුතු වීම. |

| | | |
|---|---|---|
| වෙත ලියාපදිංචි කරවා ගැනීම.<br><br>• 1944 අංක 28 දරන විහාර වන්දි ආඥා පනත ක්‍රියාත්මක කිරීම.<br><br>• 1981 අංක 42 දරන පනතින් සංශෝධිත 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.<br><br>• 1931 අංක 28 දරන විශේෂ විධිවිධාන පනත යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.<br><br>එසේ වුවද, උක්ත සඳහන් වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැනගේ මැදිහත් වීම් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක ලෙස හඳුනා ගෙන නොතිබුණි. | | |
| (ඇ) 2020 ක්‍රියාකාරී සැලැස්ම අනුව භාර හා බුදල්වලට අදාලව මහා භාරකාර ආඥා පනත යටතේ අයකරන ලද මුලධන, ආයෝජන ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු ලෙස රු.6,800,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.10,726,026 ක ආදායමක රැස් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය වූ අතර වාර්ෂික කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය සඳහන් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙහි නව භාර/බුදල් පිහිටුවීම,විහාර වන්දි, විදේශ වන්දි මුදල් ඉදිරියට ලැබීම හා පොලී ප්‍රතිශතයන්හි වෙනස්වීම් පිළිබඳව නිවැරදි පුරෝකථනයක් සිදු කිරීමේ ඇති අපහසුතාව මත ආදායම් ඇස්තමේන්තුවෙහි දක්වන ලද ඇස්තමේන්තුගත අගය අතර විචල්‍යතාවක් ඇති වී ඇත. | වාර්ෂික කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය පෙන්විය යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර, එම වාර්තාව අදාල වර්ෂයේ මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයට අදාල වාර්තා විගණන දිනය වූ 2021 ඔක්තෝබර් 06 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2020 ජූලි 06 දින විගණනය වෙත ලැබී තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වතු 11 ට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හමුවේ කාර්යාල කටයුතු ක්‍රමවත් පරිදි සිදු නොවීම මත නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු කළ නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) අධිකරණ අමාත්‍යාංශය මඟින් 2019 වර්ෂයේදී ලබා දී තිබූ වාහන 03 ක හිමිකම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර තිබුණද එම වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දින වන විට ද මෙම වාහනවල අයිතිය නිරවුල් කරගෙන තිබුණු අතර දැනට ලියාපදිංචිය මහා භාරකාර දෙපාර්තමේන්තුව නමින් පවතී. අධිකරණ අමාත්‍යාංශය මඟින් නිකුත් කිරීමේ සහතික ලබා නොදීම මත ඒවායේ වටිනාකම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් මඟින් හෙළිදරව් කිරීමට නොහැකි වූ අතර අදාල පරිදි හෙළිදරව් කිරීමට අවශ්‍ය කටයුතු කෙරේ. | දෙපාර්තමේන්තුව සතු වාහනවල වටිනාකම් ගිණුම් මඟින් හෙළිදරව් කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව යටතේ පාලනය කරනු ලබන සක්‍රීය, අක්‍රීය හා වසා දමා ඇති බූදල් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කර නොතිබුණු අතර මහා භාරකාරතැනගේ අංක PT/10/තොරතුරු/2019 හා 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපිය මගින් සක්‍රීය බූදල් සංඛ්‍යාව 110 ක් බව විගණනය වෙත දන්වා තිබුණද ක්‍රියාකාරි සැලැස්ම අනුව 2018 දෙසැම්බර් 31 දිනට බූදල් සංඛ්‍යාව 143 ක් ලෙසත් 2019 දෙසැම්බර් 31 දිනට බූදල් සංඛ්‍යාව 151 ක් ලෙසත් සඳහන් කර තිබුණි. | වර්ථමානයේ තොරතුරු යාවත්කාලින කරමින් පවති. | අදාල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |
| (ආ) 1922 අංක 1 දරන මහා භාරකාර ආඥා පනතේ 47(1) වගන්තිය ප්‍රකාරව, 2020 වර්ෂය සඳහා පිළියෙල කරන ලද භාර/ බූදල් අවසාන ගිණුම් විගණන දිනය වු 2021 ඔක්තෝබර් 06 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හමුවේ නිලධාරීන් රාජකාරියට වාර්තා කිරීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුකූල විය යුතු බැවින් කොවිඩ් තත්ත්වය පහව ගොස් කාර්යාල කටයුතු යථා තත්ත්වයට පත් වී මසකින් අවසාන ගිණුම් සකස් කර ඉදිරිපත් කළ හැක. | ගිණුම් වර්ෂයට අදාලව අවසාන ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 4 යහපාලනය

--------------

### 4.1 තිරසර සංවර්ධනය

-------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාළ වන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගෙන නොතිබුණි. | 2020 වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර 2021 වර්ෂය සඳහා තිරසාර සංවර්ධන සැලැස්ම සකස් කරන අතර එය ඉදිරි කාලය තුල කඩිනමින් ලබා දෙන බවද සඳහන් කරමි. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 87 ක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 69 ක් වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 01 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 01 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් ලෙස නිලධාරීන් 18 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | දැනට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු 18 පිළිබඳව මාර්ග ගත ක්‍රමය මගින් මාසිකව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ ත්‍රෛයි මාසිකව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරනු ලැබේ. මේ පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ ද නැවත බඳවා ගන්නා තෙක් සේවකයින් ලබා දිය නොහැකි බව පවසන ලදී. අභ්‍යාසලාභී උපාධිධාරීන් ලබා ගැනීම සහ | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතු වීම. |

ප්‍රාථමික ගණයේ සේවකයින් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. පූරප්පාඩු පවතින පරිපාලන නිලධාරී සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගත් අතර,ඔහුගේ නිල කාලය දැනට අවසන් වී ඇති අතර සේවා දිගුව අනුමත නොවුණි.